# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# බස්නාහිර පළාතේ
# පළාත් සභාව

(ප්‍රවාහන, ආර්ථික උප ව්‍යුහයන්, වෙළඳ, නිවාස හා ඉදිකිරීම, ග්‍රාම සංවර්ධන සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.)

## 1992 අංක 1 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය
**(බස්නාහිර පළාත)**

**(බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය සටහන් කළේ 1992 මාර්තු 27 වන දින)**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.


කොළඹ 7 නිදහස් චතුරශ්‍රයේ පිහිටි බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් මිළදී ගත හැක.

මිල. රු: 10.00

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# බස්නාහිර පළාතේ
# පළාත් සභාව

(ප්‍රවාහන, ආර්ථික උප ව්‍යුහයන්, වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, ග්‍රාම සංවර්ධන සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.)

## 1992 අංක 1 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා
## ප්‍රඥප්තිය
**(බස්නාහිර පළාත)**

මෙහි අංක: 01 සිට 36 දක්වා වගන්ති හා උපලේඛණ ඇතුලත් බස්නාහිර පළාතේ 1992 අංක: 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය 1992 මාර්තු මස 24 වෙනි දින පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ බව සහතික කරමි.

සභාපති
බස්නාහිර පළාත් සභාව

## බස්නාහිර පළාත 1992 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය

බස්නාහිර පළාත ඇතුළත මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා විධිමත් කිරීම සඳහාද එම විධිමත් කිරීමේ කර්තව්‍යයන් සඳහා අධිකාරියක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය නිශ්චය කොට දැක්වීම පිණිස ද බස්නාහිර පළාතේ 1990 අංක; 01 දරන මාර්ගස්ථ මගින් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය හා 1991 අංක ;2 දරන මාර්ගස්ථ මගින් ප්‍රවාහනය කිරීමේ සේවා (සංශෝධන) ප්‍රඥප්තිය ඉවත් කිරීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1 මේ ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ පළාත් සභාවේ, 1992 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු නියමයක් මගින් පළාත් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය බලාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

### 1 වන කොටස

### බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය

2 (1) මෙහි මින් මතු ''පළාත් අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යනුවෙන් හැඳින්වෙන පළාත් අධිකාරියක් පිහිටුවනු ලැබේ. පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියක් පිහිටුවීම.

(2) පළාත් අධිකාරිය (1) වන උපවගන්තියෙන් ඊට පැවරෙන නාමයෙන් සංස්ථාවක් වන්නේ ය. තවද ඊට අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති අතර, එම නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

(3) ප්‍රවාහන විෂයය භාර පළාත් අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව, පළාත් අධිකාරිය විසින් ශාඛා කාර්යාල පිහිටුවා පවත්වාගෙන යා හැකිය.

3 (1) පළාත් අධිකාරිය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය. පළාත් අධිකාරියේ සාමාජිකයෝ

(අ) ප්‍රවාහනය, වානිජ්‍යය, මුදල් හෝ පරිපාලන කටයුතු පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇතැයි සහ ඒ සම්බන්ධයෙන් පරිණත භාවයක් පෙන්වා

ඇතැයි ප්‍රවාහන විෂයය භාර පළාත් අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් පළාත් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු (මෙහි මින් මතු ''පත් කළ සාමාජික'' යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් තිදෙනෙකුගෙන්,
[illegible]

(ආ) මෙහි පහත දැක්වෙන පරිදි පත්කරනු ලබන, (මෙහි මින් මතු ''නිල බලයෙන් පත්වූ සාමාජික'' යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් සිව් දෙනකුගෙන්; එනම්

(i) ප්‍රවාහන විෂයය භාර පළාත් අමාත්‍යවරයා වි නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ පළාත් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්

(ii) මුදල් විෂයය භාර පළාත් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ පළාත් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්

(iii) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ජාතික ගමනාගමන කොමිසමේ සභාපති විමසීමෙන් පසු විෂයය භාර පළාත් ඇමති විසින් නම් කරනු ලබන සාමාජිකයෙක්

(iv) බස්නාහිර පළාතේ පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්

(2) ප්‍රවාහන විෂයය භාර පළාත් අමාත්‍යවරයා විසින් එම සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු පළාත් අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරනු ලබන්නේ ය.

(3) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එවැන්නකු ලෙස පත් කරනු ලැබුවහොත් ඒ තැනැත්තා පළාත් අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ එවැනි සාමාජිකයකු ලෙස කටයුතු කිරීමට නුසුදුස්සෙක් වන්නේය.

(4) යම් තැනැත්තකු අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කිරීමට ප්‍රථම, ඒ තැනැත්තා විසින් පළාත් අධිකාරියේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ කර්තව්‍යය ඉටුකරනු ලැබීම කෙරෙහි හානිකරඅන්දමින් බලපෑ හැකි මුල්‍ය හෝ වෙනත් සම්බන්ධතා ඔහු සතුව නොමැති බවට පළාත් අමාත්‍යවරයා සෑහීමට පත් විය යුතුය. පළාත් අධිකාරියේ කිසිම සාමාජිකයකුගේ එවැනි සම්බන්ධතාවක් නොපවතින බවට ද පළාත් අමාත්‍යවරයා වරින් වර සෑහීමට පත් විය යුතුය. මේ උපවගන්තිය යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය

යැයි පළාත් අමාත්‍යවරයා සලකන සියලු තොරතුරු සපයන ලෙස ඔහු විසින් ඉල්ලා සිටිනු ලැබූ කවර අවස්ථාවක වුවද ඒ තොරතුරු පළාත් අධිකාරියේ සාමාජිකයකු ලෙස පළාත් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ හෝ පත් කිරීමට පළාත් අමාත්‍යවරයා අදහස් කරන කවර හෝ තැනැත්තකු විසින් පළාත් අමාත්‍යවරයා වෙත සැපයිය යුතු ය.

(5) පළාත් අධිකාරිය ඇතුළත් වන්නා වූ හෝ ඇතුළත් වීමට අදහස් කරන්නා වූ යම් කොන්ත්‍රාත්තුවකට කෙලින්ම හෝ වක්‍රාකාර ...න් හෝ යම් ආකාරයක සම්බන්ධතාවක් ඇති පළාත් අධිකාරියේ කවර හෝ සාමාජිකයකු විසින් ඔහුගේ එම සම්බන්ධතාවයේ ස්වභාවය, පළාත් අධිකාරියේ රැස්වීමකදී අනාවරණය කළයුතු අතර එම අනාවරණය කිරීම පළාත් අධිකාරියේ රැස්වීම් වාර්තාවෙහි වාර්තා ගත කළ යුතුය; තවද ඒ සාමාජිකයා, පළාත් අධිකාරියේ ඒ කොන්ත්‍රාත්තුව හා සම්බන්ධ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට හෝ සහභාගී නොවිය යුතු ය.

(6) පළාත් අධිකාරියේ සෑම පත් කළ සාමාජිකයකුම, ඔහු පත් කරන අවස්ථාවේදී පළාත් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පත් කිරීමේ දින සිට ගණන් බලනු ලබන අවුරුදු තුනක් නොඉක්මන කාලයක් (8) වන, හා (9) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව ධුරය දැරිය යුතුය. තවද ඔහු (8) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය;

එසේ වුවද අධිකාරියේ පත් කළ සමාජිකයකුගේ පුරප්පාඩුවක් සඳහා පළාත් අමාත්‍යවරයා විසින් පත් කරන සාමාජිකයකු, කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර ...යෙන් නො ගෙවී ඉතිරිව ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය ... ය.

(7) සභාපතිවරයාගේ ධුර කාලය, (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පළාත් අධිකාරියේ ඔහු සාමාජිකත්වය දරන කාල සීමාව විය යුතුය.

(8) පළාත් අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින්, කවර හෝ පත් කළ සාමාජිකයකු, හේතු නොදක්වා ධුරයෙන් ඉවත් කළ හැකි අතර එසේ ධුරයෙන් ඉවත් කිරීම කිසිම අධිකරණයකදී ප්‍රශ්න කළ නොහැකි විය යුතුය.

(9) පළාත් අමාත්‍යවරයා විසින් (8) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබුයේ පළාත් අධිකාරියේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන්ද, ඒ නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දිනයේදී ඒ සාමාජිකයා ඔහුගේ ධුරයෙන් ඉවත් විය යුතු ය.

(10) ප්‍රවාහන විෂයය භාර පළාත් අමාත්‍යවරයා වෙත, තත් කාර්යය සඳහා යවන ලිපියක් මගින්, පළාත් අධිකාරියේ කවර හෝ පත්කළ සාමාජිකයකු විසින්, කවර අවස්ථාවක වුවද සාමාජිකයකු වශයෙන් හෝ සභාපතිවරයා වශයෙන් හෝ ඔහු දරන ධූරයෙන්, ඉල්ලා අස්විය හැකිය.

(11) පළාත් අධිකාරියේ කවර හෝ සාමාජිකයකු, රෝගාතුර වීම නිසා හෝ වෙනත් යම් අබලතාවක් නිසා හෝ, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ඔහුගේ ධූරයේ කාර්ය ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක,

(අ) ඔහු පත් කළ සාමාජිකයකු නම්, ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීම සඳහා, (1) (අ) උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, වෙනත් තැනැත්තකු පළාත් අමාත්‍ය වරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(ආ) ඔහු (i) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) හෝ (iii) වන අනුඡේද යටතේ නම් කරන ලද සාමාජිකයකු නම්, ඒ සාමාජිකයා නම් කළ පළාත් අමාත්‍යවරයා විසින්, ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකිය.

(ඇ) ඔහු (i) හෝ (iv) උප ඡේද යටතේ දක්වා ඇති නිලධරයකු නම් එම නිලධරයාගේ තනතුරේ වැඩ බැලීමට පත්කර ඇති තැනැත්තා එම නිලධරයා වෙනුවට බැලීමට පත්කරනු ලැබිය යුතුය.

(12) රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ, පළාත් අධිකාරියේ සභාපතිවරයා ඔහුගේ ධූරයේ කාර්ය ඉටුකිරීමට අපොහොසත් වන අවස්ථාවක, සභාපතිවරයා ලෙස වැඩ බැලීම සඳහා වෙනත් සාමාජිකයකු, පළාත් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(13) පළාත් අධිකාරියේ සියලු සාමාජිකයන්ට හෝ යම් සාමාජිකයකුට හෝ පළාත් අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර පළාත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික, දීමනා සහ වෙනත් වියදම්, පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

4(i) පළාත් අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින, පළාත් අධිකාරියේ සෑම රැස්වීමකම ඔහු මූලාසනය දැරිය යුතුය. පළාත් අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත්,එවිට, පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගන්නා යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

පළාත් අධිකාරියේ කටයුතු කිරීම.

(2) රැස්වීම අවශ්‍යයයි පළාත් අධිකාරිය සලකන ඕනෑම අවස්ථාවකදී පළාත් අධිකාරිය රැස්විය යුතුය.

(3) පළාත් අධිකාරියේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට, ඔහුගේ ඡන්දයට අතිරේකව, තීරක ඡන්දයක් තිබිය යුතුය.

(4) පළාත් අධිකාරියේ යම් රැස්වීමක්, සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් ගණපූරණය විය යුතුය.

(5) පළාත් අධිකාරියේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබුණද ඒ නොතකා පළාත් අධිකාරියට ක්‍රියා කළහැකි අතර, අධිකාරියේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ නැතහොත් නම් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හෝ හේතුවෙන්ම පමණක්, පළාත් අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ කෘත්‍යයක් හෝ නිර්බල නොවන්නේ ය; නිර්බල සේ නොසැලකිය යුත්තේ ය.

(6) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, පළාත් අධිකාරියේ රැස්වීම් සම්බන්ධ සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය සම්බන්ධ කාර්ය විධානයට අදාළව, පළාත් අධිකාරිය විසින්, රීති සෑදිය හැකිය.

5 (i) පළාත් අධිකාරියේ මුද්‍රාව, පළාත් අධිකාරියේ සභාපතිවරයා භාරයේ තිබිය යුතුය.

පළාත් අධිකාරියේ මුද්‍රාව

(2) පළාත් අධිකාරියේ මුද්‍රාව, පළාත් අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට වෙනස් කර ගත හැකිය.

(3) පළාත් අධිකාරියේ මුද්‍රාව, පළාත් අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිටදී හැර කිසිම ලේඛනයකට හෝ සාධන පත්‍රයකට හෝ නොතැබිය යුතුය. ඒ සාමාජිකයන් දෙදෙනාගෙන් එක් සාමාජිකයකු පළාත් අධිකාරියේ සභාපතිවරයා විය යුතුය. තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනාම ඒ ලේඛනයට හෝ සාධන පත්‍රයට හෝ අත්සන් තැබිය යුතුය.

## ii වන කොටස
## පළාත් අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය

**පළාත් අධිකාරියේ බලතල කාර්ය සහ කර්තව්‍ය**

6 (i) පළාත් අධිකාරිය පහත සඳහන් බලතල, කාර්යයන් හා කාර්තව්‍යයන් ඉටුකළ යුතුය;

(අ) බස්නාහිර පළාත ඇතුළත මහජන මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත්, පිළිගත් මනා තත්ත්වයක බස් සේවයක් පවතින්නේ ද යන්න වග පිළිබඳව සමීක්ෂණය කිරීම සහ ධාවන කාල සටහන් පිළියෙල කිරීම හා ධාවකයන් එම කාල සටහන් පිළිපදින බවට වගබලා ගැනීමට පියවර ගැනීම;

(ආ) මගී ප්‍රවාහනය සඳහා බස්රථ පාවිච්චි කිරීමට බලය දෙන මගී සේවා අවසර පත් නිකුත් කිරීම හෝ ඒ අවසර පත් අලුත් කිරීම,

(ඇ) මගී සේවා අවසර පත් නිකුත් කරනු ලබන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි පිළිපදින බවට වග බලා ගැනීම හා ඒවා බලාත්මක කිරීම;

(ඈ) අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියාත්මක කළ යුතු හා ඉටුකළ යුතු බලතල, කාර්ය හා කර්තව්‍ය සඳහා අවශ්‍ය විය හැකි වාර වාර්තා හා වෙනත් තොරතුරු සපයන ලෙස මගී සේවා අවසර පත්‍රධාරීන්ට නියම කිරීම;

(ඉ) මගීන්ගේ ආරක්ෂාව, හා සැප පහසුව සහතික කිරීම සඳහා, විශේෂයෙන්ම මෙහි පහත දක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයකට අදාළව නියෝග සකස් කිරීම හා ඒවා බලාත්මක කිරීම; එනම්

(1) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රවල බලය යටතේ ධාවනය කරන බස් රථවල තිබිය යුතු පුවරු හා සලකුණු;

(2) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රවල බලය යටතේ ධාවනයේ යොදවන බස්රථවල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් විසින් රැගෙන යා යුතු

ලියකියවිලි හා ඒවායේ ඇතුළත් කළ යුතු විස්තර;

(3) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක බලය යටතේ බස් රථයක් ධාවනයේ යොදන තැනැත්තකු විසින් පිළිපැදිය යුතු ප්‍රමිති නියම කිරීම සහ ඒ ප්‍රමිති උල්ලංඝනය වන ක්‍රියා හෝ නොකර හැරීම තහනම් කිරීම;

(4) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක බලය යටතේ ධාවනයේ යොදවන බස් රථයක ගමන් වාර සම්බන්ධව තබාගත යුතු වාර්තා;

(5) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රධාරියකු විසින් ඒ අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොද වන බස්රථවල රියැදුරන් සහ කොන්දොස්තර වරුන් ලෙස සේවයේ නියුක්ත කරන තැනැත් තන් සම්බන්ධයෙන් සහ ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන හා නිමකරන වේලාවල් හා ඔවුන්ට ලැබෙන ගිමන් හැරීමේ විවේක කාලයන් සම්බන්ධයෙන් අවසරපත්‍රධාරියා විසින් තබාගත යුතු වාර්තා සහ වේලා සටහන් කරුවන් සහ ස්ථානපාලකවරුන් වෙනුවෙන් පළාත් අධිකාරිය විසින් තබාගත යුතු වාර්තා;

(6) මේ ප්‍රඥප්තිය යටතේ තබන වාර්තා ආරක්ෂා කිරීම, නියෝගවලින් නිශ්චිතව නියමිත යම් බලධරයකු විසින් ඒ වාර්තා පරීක්ෂා කිරීම, එසේ පරීක්ෂා කරනු ලැබීම සඳහා ඒ වාර්තා එකී බලධරයා විසින් ඉල්ලා සිටිනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීම;

(ඊ) බස් නැවතුම්පොළවල් සහ බස් මගී ආවරණ සැපයීම සහ/හෝ පළාත්පාලන ආයතන විසින් ඒවා සැපයීම අධීක්ෂණය කිරීම:

(උ) බස් ධාවකයන්ට විශේෂඥ උපදෙස් හා මාර්ගදේශකත්වය සැපයීම;

(ඌ) මෙහි සඳහන් බලතල, කාර්ය හෝ කර්තව්‍ය

කිසිවක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියළු කොන්ත්‍රාත්වලට හෝ ගිවිසුම් වලට, කෙලින්ම නැතහොත් ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු සමග හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ ඇතුළත් වීම සහ ඒවා ඉටුකිරීම හෝ සපුරා ලීම;

(එ) යම් වංවල හෝ නිශ්වල දේපළක් අත්කර ගැනීම හා දැරීම හෝ අත්කර ගන්නා ලද හෝ දරන්නා වූ වංවල හෝ නිශ්වල දේපලක් බැහැර කිරීම;

(ඒ) පළාත් අධිකාරිය විසින් සපයනු ලබන යම් සේවා වක් සඳහා ගාස්තු අයකිරීම;

(ඔ) මුදලින් හෝ අන්‍යාකාරයෙන් වූ ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ සහනාධාර පිළිගැනීම සහ පළාත් අධිකාරියේ කවර හෝ අරමුණක් අරභයා ඒවා යොදා ගැනීම, සහ

(ඕ) මේ ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්-බන්ධව වූ හෝ ඊට ආනුෂංගික වූ සියලු ක්‍රියා හෝ දේවල් කිරීම.

(ඉ) වන උපවගන්තිය යටතේ සාදනු ලබන නියෝග ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර ඒවා එහි නිශ්වය කොට දක්වෙන දිනයක සිට ක්‍රියාත්-මක විය යුතුය.

(2) අධිකාරිය විසින් බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවා ඇති ජාතික ගමනාගමන කොමිෂම විසින් වරින් වර දියහැකි ප්‍රතිපත්තිමය ඇග පෙන්වීම් හා උපදෙස් වලට අනුකූල විය යුතුය.

විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇති බව

7 (1) අධිකාරිය විසින් එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සම්බන්ධයෙන් පළාත් අධිකාරියට කලින් කල පළාත් අමාත්‍යවරයා විසින් පොදු හෝ විශේෂ විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, පළාත් අධිකාරිය විසින් ඒ විධාන ක්‍රියාවේ යෙදිය යුතුය.

(2) පළාත් අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් තමා විසින් නියම කරනු ලබන ආකෘතියකින් තමා වෙත වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු සපයන ලෙස, පළාත් අමාත්‍යවරයා විසින් කලින්

කල ලිඛිත විධාන කරනු ලැබිය හැකි අතර, පළාත් අධිකාරිය විසින් ඒ සෑම විධානයක්ම ඉටු කළ යුතුය.

පළාත් අධිකාරියේ බලතල පැවරීම.

8. පළාත් අධිකාරිය විසින්, මේ ප්‍රඥප්තිය යටතේ ඊට අයත් බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරෙන් කිසිවක් අධිකාරියේ සභාපතිවරයා වෙත හෝ එහි යම් නිලධරයකු වෙත, ලියවිල්ලක් මගින් පවරා දිය හැකිය.

නිත්‍ය සේවා සඳහා මගී සේවා අවසර පත්‍ර

9. (1) මෙහි (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කිසිම තැනැත්තකු විසින්, මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින හෝ ඉන් පසුව, පළාත් අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද්ද වූ සහ තත් කාලයෙහි බලාත්මකව පවතින්නා වූ මගී සේවා අවසර පත්‍රයක් යටතේ හැර, ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා, මගීන් ප්‍රවාහනය කිරීම පිණිස, පළාත ඇතුළත ආරම්භ වන නිත්‍ය සේවාවක් සඳහා බස් රථයක් පළාත ඇතුළත ධාවනය නොකළ යුතු ය.

(2) පළාත ඇතුළත ආරම්භ වන මාර්ගයක් සම්බන්ධයෙන් 1990 අංක; 1 දරන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍ර සහ බස්රථ ධාවකයන් විසින් දැන්ට දරනු ලබන මාර්ග අවසර පත්‍ර මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අවසර පත්‍ර නිකුත් කරනු ලැබුවේ යම් කාල සීමාවකට ද ඒ කාල සීමාව හෝ මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින සිට හය මාසයක් වූ කාල සීමාව යන දෙකින් අඩු කාල සීමාව සඳහා ඒ අවසර පත්‍ර වලංගු වන්නේ ය.

(3) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේදී හෝ ඉන් පසුව, කිසිම තැනැත්තකු විසින්, ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මහා මාර්ග ඔස්සේ මගීන් ප්‍රවාහනය කිරීමේ නිත්‍ය සේවය සඳහා, බස් රථයක් නොවන වෙනත් වාහනයක් යොදා නොගත යුතුය.

(4) මේ ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යොදා ගනු ලැබ ඇති ඕනෑම වාහනයක් පළාත් අධිකාරිය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් කරන ලද පැමිණිල්ලක් මත, යම් පොලිස් නිලධරයකු විසින් තහනමට ගත හැකි අතර ඒ වාහනය එසේ තහනමට ගනු ලැබුයේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල ප්‍රදේශය ඇතුළත දී ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව, ඒ වාහනය ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(5) යම් වාහනයක් (4) වන උපවගන්තියේ විධිවිධාන යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක,

මහෙස්ත්‍රාත්වරයා විසින් නඩු විභාගය අවසන් කරන තෙක් ඒ වාහනය රඳවා තබන ආඥාවක් හෝ නඩුවට අදල අවස්ථාගත කරුණු අනුව, මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඒ වාහනය මුදා හරින ආඥාවක් හෝ කළ හැකිය.

බස්රථවලින් මගී ප්‍රවාහනය හිමිකම.

10. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන මගී සේවා අවසර පත්‍රයකින්, ඒ අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් මාර්ගයේ හෝ මාර්ග වල මගී ප්‍රවාහනය සඳහා නිත්‍ය සේවයක් පවත්වාගෙන යාම පිණිස, ඒ අවසර පත්‍ර ධාරියා ලියාපදිංචි අයිතිකරු වන බස් රථයක්, ඒ අවසර පත්‍රයට අදල කොන්දේසිවලට අනුකූලව යොද ගැනීමට, ඒ අවසර පත්‍රධාරියාට හිමිකම ලැබෙන්නේය.

මගී සේවා අවසර පත්‍ර සඳහා ඉල්ලුම් කිරීම.

11. (1) මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම, ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන්නේ යම් බස්රථයක් සඳහා ද ඒ බස් රථයේ ලියාපදිංචි අයිතිකරු විසින් පළාත් අධිකාරිය වෙත, නියමිත ආකෘතිය අනුව, ඉදිරිපත් කළ යුතුය.

(2) මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකු විසින්ම (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රය සමග, පහත දක්වෙන විස්තර ඇතුළත්, නියමිත ආකෘතියෙහි වූ ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය.

(අ) ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් ගෙනයාම පිණිස ඒ බස්රථය ධාවනයට යොද ගැනීමට යෝජිත මාර්ගය හෝ මාර්ග පිළිබඳ විස්තර;

(ආ) 12 වන වගන්තිය යටතේ තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පළාත් අධිකාරිය ඉල්ලා සිටින වෙනත් විස්තර.

මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට පළාත් අධිකාරියට ඇති බලය

12. (1) මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් හෝ එය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් හෝ එවැනි අවසර පත්‍රයක් අලුත් කිරීම සම්බන්ධයෙන් හෝ පූර්ණ (2) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, පළාත් අධිකාරියට බලය හා අභිමතය ඇත්තේ ය.

(2) මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමේ දී හෝ එය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමේදී හෝ එය අලුත් කිරීමේදී ද අවසර

පත්‍ර ප්‍රදානය කළ හැකි මාර්ගය හෝ මාර්ග සම්බන්ධයෙන්ද ස්වකීය අභිමතය පාවිච්චි කිරීමේ දී, පළාත් අධිකාරිය ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගී ප්‍රවාහන සේවා පහසුකම් අවශ්‍ය තැනැත්තන් මෙන්ම ඒ පහසුකම් සපයන තැනැත්තන් ද ඇතුළුව, පොදු මහජනයාගේ යහපත පිළිබඳව මූලික වශයෙන් සැළකිලිමත් විය යුතු අතර, විශේෂයෙන් පහත සඳහන් කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

(අ) යෝජිත පරිදි මගීන් ප්‍රවාහනය කිරීම පොදු යහපත පිණිස කොතෙක් දුරට අවශ්‍යද යන වග;

(ආ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල යෝග්‍යතාව,

(ඇ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල හෝ ඉන් යම් මාර්ගයක හෝ දැනටමත් මගී ප්‍රවාහන සේවයක් ඇත්නම්, එය කොතෙක් දුරට ප්‍රමාණවත්ද යන වග;

(ඇ) (ප්‍රමාණවත්, යෝග්‍ය සහ කාර්යක්ෂම සේවාවන් සැපයීමද ඇතුළුව) සමස්ත වශයෙන්, ගමනාගමන පහසුකම්වලට අදළව ප්‍රදේශයේ අවශ්‍යතා සහ දුම්රිය මගින් කෙරෙන ප්‍රවාහනය ඇතුළුව සියලු ආකාරයේ මගී ප්‍රවාහන සේවා සම්බන්ධීකරණය;

(ඉ) යම් ප්‍රදේශයක හෝ යම් මාර්ගයක ඇති (දුම්රිය මගින් සපයෙන පහසුකම්ද ඇතුළුව) ප්‍රවාහන පහසුකම්, පළාත් අධිකාරියේ මතය අනුව ඒ ප්‍රදේශයේ හෝ ඒ මාර්ගය ඔස්සේ මහජනයා සඳහා පවත්නා ප්‍රවාහන අවශ්‍යතා සාධාරණ ප්‍රමාණයකට සපුරාලීමට තරම් සතුටුදයක නම් සහ කාර්යක්ෂම නම්, ප්‍රධාන වශයෙන් එම ප්‍රදේශයෙහිම හෝ ප්‍රධාන වශයෙන් එම මාර්ගය ඔස්සේම, එකී ප්‍රවාහන පහසුකම් සමඟ තරඟකාරීව මගී ප්‍රවාහනය සඳහා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම යෝග්‍ය නොවන බව.

13. (1) යම් තැනැත්තකු විසින් නියමිත ගාස්තුව හෝ ගෙවනු ලැබුවහොත් හැර, පළාත් අධිකාරිය විසින්, මේ ප්‍රඥප්තිය යටතේ ඒ තැනැත්තාට මගී සේවා අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය. මගී සේවා අවසර පත්‍රයක වලංගු කාලය

(2) සෑම මගී සේවා අවසර පත්‍රයක්ම-

(අ) නියමිත ආකෘතිය අනුව විය යුතුය.

(ආ) එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, නිකුත් කරන ලද දිනයේ සිට මාස දෙළහක සිට මාස තිස් හයක කාල සීමාවක් වලංගුව පවතින්නේ ය.

අවසර පත්‍රයකට අදාල කළ යුතු කොන්දේසි

14. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධානවලට යටත්ව, මේ ප්‍රඥප්තියේ යටතේ නිකුත් කරනු ලබන සෑම මගී සේවා අවසර පත්‍රයකම, මහජනතාවගේ ආරක්ෂාව සහ සැප පහසුව පිණිස පහත සඳහන් කරුණු නියම කරන්නා වූ කොන්දේසි ඇතුළුව පළාත් අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි සියළු කොන්දේසි ඇතුළත් කරනු ලැබිය යුතුය.

(අ) අය කරන ගාස්තු, මගී සේවා අවසර පත්‍රය සඳහා වූ අයදුම්පත්‍රයේ සඳහන් කළයුතු බව;

(ආ) අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස්රථය, අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් මාර්ගයේ හෝ මාර්ගවල ධාවනයේ යෙදවිය යුතු බව;

(ඇ) (නියම කර ඇති අවස්ථාවලදී) කාල සටහනෙහි සහ ගමන් ගාස්තු චක්‍රයෙහි පිටපත් අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස් රථයේ රැගෙන යා යුතු බව සහ එහි තුළ ප්‍රදර්ශනය කර තැබිය යුතු බව;

(ඈ) අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස් රථය, සියළු අවස්ථාවන්හිදී ධාවනයට සුදුසු හා යෝග්‍ය තත්ත්වයකි පවත්වා ගතයුතු බව;

(ඉ) බස්රථවල රියැදුරන් හෝ කොන්දොස්තර වරුන් අඛණ්ඩව සේවයේ නිරතව සිටිය හැකි කාලය සහ ඔවුන්ගේ වැඩ කරන පැය ගණන හා විවේක කාල සම්බන්ධයෙන් හා ඔවුන්ගේ වේතන සම්බන්ධයෙන්, යම් ලිඛිත නීතියක ඇති නියමයන් අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස් රථයේ රියැදුරු සහ කොන්දෙස්තරවරයා සම්බන්ධයෙන් පිළිපැදිය යුතු බව.

අවසර පත්‍රයේ විස්තර දැක්වීම

15. පළාත් අධිකාරිය විසින්, මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කරන අවස්ථාවේදී, ධාවනයේ යෙදීම පිණිස ඒ අවසර පත්‍රයෙන් බලය දෙනු ලබන බස්රථය, එහි හඳුනාගැනීමේ

අංකය සහ අවශ්‍යයයි පළාත් අධිකාරිය සලකන වෙනත් විස්තර ඒ අවසර පත්‍රයේ සඳහන් කිරීමෙන්, නිශ්චිත වශයෙන් අවසර පත්‍රයේ දක්වනු ලැබිය යුතුය.

විධාන නිකුත් කිරීමට පළාත් අධිකාරියට බලය ඇති බව.

16. මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ කවර හෝ තැනැත්තකු මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධාන අනුව ක්‍රියා කරන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍යයයි පළාත් අධිකාරිය අදහස් කරන විධාන ඒ තැනැත්තාට නිකුත් කළ හැකි අතර, ඒ විධාන නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් ඒ විධාන වල නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඒ විධාන අනුව ක්‍රියා කළ යුතු ය.

අවසර පත්‍රය පැවරිය නොහැකි බව.

17. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක්, වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලැබිය නොහැකි අතර, ඒ අනුව එවැනි යම් පැවරීමක් ශූන්‍ය හා බල රහිත වන්නේ ය.

අවසරපත්‍රධාරියා විසින් විස්තරවල වෙනසක් පළාත් අධිකාරිය වෙත දැනුම් දිය යුතු බව.

18. මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයෙහි අවසරපත්‍රධාරියා විසින් සඳහන් කරන ලද විස්තරවල යම් වෙනසක් සිදුවූ දින සිට දවස් තිහක් ඇතුළත, ඒ අවසරපත්‍රධාරියා විසින් ඒ වෙනස පිළිබඳව පළාත් අධිකාරිය වෙත ලියවිල්ලකින් දැනුම් දී එහි එකඟත්වය ලියවිල්ලකින් ලබාගත යුතුය.

අවසර පත්‍රය අළුත් කිරීම

19. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රධාරියකු විසින්, පළාත් අධිකාරිය වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ විට–

(අ) ඒ මගී සේවා අවසර පත්‍රධාරියා මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව හෝ ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන අනුව ක්‍රියාකර ඇති බවට හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබ නොමැති බවට පළාත් අධිකාරිය සෑහීමකට පත්වන්නේ නම් සහ,

(ආ) මගී සේවා අවසරපත්‍රධාරියා අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවන්නේ නම්,

ඒ අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වන දින සිට එක් අවුරුද්දක කාලයක් සඳහා ඒ අවසර පත්‍රය පළාත් අධිකාරිය විසින් අලුත් කරනු ලැබිය හැකිය.

**අවසර පත්‍රය අවලංගු කිරීම**

20. (1) මගී අවසර පත්‍රධාරියා විසින්-

(අ) මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගයක යම් විධිවිධානයක් හෝ උල්ලංඝනය කර ඇති බවට;

(ආ) 16 වන වගන්තිය යටතේ ඔහු වෙත නිකුත් කරන ලද යම් විධානයක් අනුව ඔහු ක්‍රියා කර නොමැති බවට, හෝ

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ ඔහු විසින් යවනු ලැබූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ වාර වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරුවල හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක හෝ අසත්‍ය හෝ වැරදි බව ඔහු දන්නා යම් විස්තර සපයා ඇති බවට,

පළාත් අධිකාරිය සෑහීමට පත් වුවහොත් යම් මගී සේවා අවසර පත්‍රයක් පළාත් අධි-කාරිය විසින් අවලංගු කරනු ලැබිය හැකිය.

(2) පළාත් අධිකාරියේ තීරණයට විරුද්ධව අභියාචනය කළ හැකි කාලය ඉකුත් වන තෙක් හෝ අභියාචනයක් කර ඇත්නම් ඒ අභියාචනය පිළිබඳව සුදුස්සක් කරනු ලබන තෙක්, (1) වන උපවගන්තිය යටතේ අවසර පත්‍රයක් අවලංගු කිරීම, බලාත්මක නොවිය යුතු ය.

**පළාත් අධිකාරියේ තීරණ ය සහ ඊට හේතු ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රධාරියාට දැනුම් දිය යුතු බව.**

21. පළාත් අධිකාරිය විසින් මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් අවසර පත්‍රයක් අවලංගු කිරීමට තීරණය කරනු ලැබූ අවස්ථාවක, පළාත් අධිකාරිය විසින් එහි තීරණය සහ ඊට හේතු ද අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරුට හෝ අවසරපත්‍රධාරියාට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

22. (1) (අ) මගී සේවා අවසර පත්‍රයක් දීම හෝ එය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින්; හෝ

(ආ) අවසර පත්‍රය අවලංගු කරමින්

**අභියාචනය**

පළාත් අධිකාරිය විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්ත, මගී සේවා අවසර පත්‍රයක් ඉල්ලුම්කරුවකු හෝ මගී සේවා අවසර පත්‍රධාරියකු හෝ විසින් තමා වෙත ඒ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දවස් දහහතරක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත අභියාචනය කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින්–

(අ) අභියාචනයට ඉඩදී, අවසර පත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ අලුත්කරන ලෙස හෝ පළාත් අධිකාරිය වෙත විධාන කළ හැකිය; නැතහොත්

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කළ හැකිය.

(3) (2) වන උප වගන්තිය යටතේ පළාත් අධිකාරිය වෙත නිකුත් කරනු ලැබූ කවර හෝ විධානයක් අනුව පළාත් අධිකාරිය ක්‍රියා කළ යුතුය.

23. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ සෑම මගී සේවා අවසර පත්‍රයක්ම ඒ අවසර පත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් බස් රථයක් සඳහා ද එබස් රථයේ වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රකටව පෙනෙන අයුරින් ප්‍රදර්ශනය කළ යුතු ය. අවසර පත්‍රය වින්ඩ්ස්– ක්‍රීනයේ ප්‍රදර්ශනය කළ යුතු බව.

24. මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ සහ තම කාර්යයන් ඉටුකිරීමේ කාර්ය සඳහා පළාත්බද අධිකාරියට අවශ්‍යවන යම් වාර වාර්තාවක්, තොරතුරක් හෝ කරුණු පැහැදිලි කිරීමේ දන්වීමේ සඳහන් කරනු ලබන කාලය ඇතුලත සපයන ලෙස මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් දරන්නෙකුට පළාත්බද අධිකාරිය විසින් ලියවිල්ලකින් දැන්වීමක් කළ හැකි අතර, ඒ දැන්වීමේ නියමයන් පිළිපැදීම ඒ අවසර පත්‍රය දරන්නාගේ යුතුකම වන්නේ ය. අධිකාරියට තොරතුරු හා වාර්තා සැපයීම.

## iii කොටස

පළාත්බද අධිකාරියේ කාර්ය මණ්ඩලය–

25 (1) පළාත්බද අධිකාරිය විසින්, පළාත් සභා අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ අනුමැතිය ඇතිව, අධිකාරිය සඳහා සාමාන්‍යාධිකාරිවරයෙකු පත්කරනු ලැබිය යුතුය. පළාත්බද අධිකාරියේ සාමාන්‍යාධි කාරි වරයා.

(2) පළාත්බද අධිකාරියේ එදිනෙද වැඩකටයුතු මෙහෙයවීම ද, අධිකාරියේ සේවා නියුක්තයන් පිළිබඳ පරිපාලනමය පාලනය ද අධිකාරියේ සාමාන්‍ය විධානයට හා පරිපාලනයට යටත්ව, සාමාන්‍යාධිකාරිවරයාට භාරකරනු ලැබිය යුතුය.

(3) මේ ප්‍රඥප්තියෙන් අධිකාරියට පැවරෙන යම් බලතල හා කර්තව්‍යයන් අතුරෙන් (රෙගුලාසි සෑදීමේ බලතල හැර) කාර්යක්ෂම පරිපාලනයට අවශ්‍ය යයි අධිකාරිය අදහස් කරන බලතල හා කර්තව්‍යයන් පළාත් අධිකාරිය විසින් වරින්වර සාමාන්‍යාධිකාරිවරයාට

පවරා දිය හැකිය. සාමාන්‍යාධිකාරීවරයා එවැනි බලතල පළාත් අධිකාරියේ මග පෙන්වීම හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කළ යුතුය.

(4) තමාගේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතරින් පළාත්බද අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තයකුට පැවරීම අවශ්‍ය යයි සාමාන්‍යාධිකාරීවරයා කලින්කල සලකන බලතල, කර්තව්‍ය හෝ කාර්ය, පළාත්බද අධිකාරියේ ලියවිල්ලකින් වූ අනුමැතිය ඇතිව, සාමාන්‍යාධිකාරීවරයා විසින් ලියවිල්ලකින්, ඒ සේවා නියුක්තයාට පැවරිය හැකි අතර, එවැනි යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරනු ලැබ යම් සේවා නියුක්තයෙකු විසින් සාමාන්‍යාධිකාරීවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධාන වලට යටත්ව ඒවා ක්‍රියාත්මක කළ යුතුය;

(5) පළාත් සභා අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය නොමැතිව සාමාන්‍යාධිකාරීවරයා ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුතුය.

පළාත්බද අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පත්වීම් ආදිය

26 (1) පළාත්බද අධිකාරිය විසින්

(අ) පළාත්බද අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි සළකනු ලබන කාර්ය මණ්ඩලයක් පත්කිරීම සහ එම කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය පවත්වා ගෙන යෑම,

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම,

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ, සේවා නියම හා කොන්දේසි නිරණය කිරීම.

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථ සාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම;

කළ හැකිය.

(2) පළාත්බද අධිකාරියේ ඉල්ලීමපිට, රජයේ සේවයේ යම් නිලධාරියකු එම නිලධාරියාගේද එම නිලධාරියා සේවයේ නියුක්ත කරවනු ලැබ සිටියේ යම් අමාත්‍යාංශයක් විසින් ද නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේ ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේද රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වරයාගේද කැමත්ත ඇතිව පළාත්බද අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා පළාත්බද අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

(3) නිශ්චිත කාල සීමාවක් ආණ්ඩුවට හෝ පළාත් සභාවකට හෝ සේවය කිරීමට එකඟවෙමින් ආණ්ඩුව හෝ පළාත් සභාවක් සමඟ හෝ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තෙකු පළාත්බද අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා පළාත්බද අධිකාරියට සේවය කරන යම් සේවා කාලයක් ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ එකඟත්වයට යටත්ව ඒ ගිවිසුමේ බැඳීම ඉටුකිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට හෝ එම පළාත් සභාවට හෝ කරනු ලබන සේවයක් ලෙස සැලකිය යුතුය.

## IV වන කොටස

## මුදල්

27 (1) පළාත්බද අධිකාරියට අධිකාරියේම අරමුදලක් තිබිය යුතුය. *පළාත්බද අධිකාරියේ අරමුදල*

(2) පළාත්බද අධිකාරියේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවිය යුතුය.

(අ) මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම හා අළුත්කිරීම මත අයකරනු ලබන මුදල් හැර, ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී, හා ඉටු-කිරීමේදී පළාත්බද අධිකාරියට ලැබෙන සියළු මුදල් ප්‍රමාණයන්,

(ආ) බස්නාහිර පළාතේ පළාත් සභාවෙන් ලැබෙන ආධාර මුදල් ද ඇතුළුව අධිකාරියේ බැරට උපචිත වන සියළු මුදල්:

(3) මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේදී හෝ අළුත්කිරි-මේදී ගාස්තු වශයෙන් අයකරනු ලබන මුදල් බස්නාහිර පළාතේ පළාත් සභාවේ පළාත් අරමුදලට බැරවිය යුතුය. එම මුදල් නිසි පරිදි ගිණුම්ගත කිරීම පිළිබඳව සාමාන්‍යාධිකාරිවරයා වගකිව යුතුය.

(4) මේ ප්‍රඥප්තිය සහ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පළාත්බද අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම, අධිකාරියේ සාමාජිකයන්ට හා අධිකාරියේ සේවා නියුක්ත-යන්ට පාරිශ්‍රමික ගෙවීම පළාත්බද අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සම්-බන්ධයෙන් දරනු ලබන යම් වියදම් ගෙවීමේ කාර්ය සඳහා සහ කලින්කල අධිකාරිය විසින් බලය දෙනු ලැබිය හැකි වෙනත් කාර්ය සඳහා පළාත්බද අධිකාරිය විසින් අධිකාරියේ අරමුදල් උපයෝගී කරගත හැකිය.

අධිකාරියේ ණය ගැනීමේ බලතල.

28 මේ ප්‍රඥප්තිය යටතේ පළාත්බද අධිකාරියේ කාර්ය ඉටුකිරීමේදී සිය වගකීම ඉටුකිරීම සඳහා අධිකාරියට අවශ්‍ය වනු ලබන මුදල් පළාත්සභා අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද පොදු අවසරයක නියමයන්ට අනුකූලව, අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකාරිය විසින් තාවකාලිකව ණයට ගත හැකිය.

එසේ වුවද, පළාත්බද අධිකාරිය විසින් මේ වගන්තිය යටතේ ලබා ගන්නා ලද තාවකාලික ණය මුදල් වෙනුවෙන් ගෙවීමට ඉතිරිව ඇති මුදල, කිසිම අවස්ථාවකදී, මුදල් විෂය භාර පළාත් සභා අමාත්‍යවරයා විමසා පළාත්සභා අමාත්‍යවරයා විසින් නියම කරන මුදල ප්‍රමාණයක් නොඉක්මවිය යුතුය.

අධිකාරියේ මුදල් වර්ෂය හා ගිණුම් විගණනය

29 (1) පළාත්බද අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

(2) පළාත්බද අධිකාරියේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියළු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට අධිකාරිය විසින් සලසුවනු ලැබිය යුතුය.

(3) පළාත් අධිකාරිය එහි ගිණුම් නිතිපතා විගණනය කරවිය යුතුය.

## V වන කොටස

## පොදු විධිවිධාන

රීති සෑදීමට අධිකාරියට බලය ඇති බව

30 (1) පළාත්බද අධිකාරියේ කටයුතු කළමණාකරනය කිරීම සහ මගී ප්‍රවාහන සමාගම් ආදියෙහි සේවයේ යෙදෙන සියළු සේවකයන්ට අදාල අවම වැටුප්, නිවාඩු, හා සේවක වරප්‍රසාද පිළිබඳ රීති ඇතුළුව රීති සෑදීමට මේ ප්‍රඥප්තියෙන් බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියළු කාරණ හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සෑදිය හැකිය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ පළාත්බද අධිකාරිය විසින් සාදන ලද කිසිම රීතියක්, පළාත් සභාව විසින් අනුමත කරනු ලැබ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතුය.

මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය අවලංගු කිරීම.

31 (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට 1991 අංක 2 දරන මාර්ගස්ථ මගින් ප්‍රවාහනය කිරීමේ සේවා (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත බස්නාහිර පළාතේ 1990 අංක 01 දරන මාර්ගස්ථ මගින් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම නතර විය යුතුය.

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට බස්නාහිර පළාතේ 1990 අංක 01 දරන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය යටතේ සංස්ථාපනය කරන ලද පහත සඳහන් පෞද්ගලික බස්රථ ධාවකයන්ගේ දිස්ත්‍රික්ක සමිති ක්‍රියාත්මක වීම නතර විය යුතුය.

(අ) කොළඹ දිස්ත්‍රික්කයේ අංක 1 දරණ පෞද්ගලික බස්රථ ධාවකයින්ගේ සමිතිය

(ආ) කොළඹ දිස්ත්‍රික්කයේ අංක 2 දරණ පෞද්ගලික බස්රථ ධාවකයින්ගේ සමිතිය

(ඇ) කොළඹ දිස්ත්‍රික්කයේ අංක 3 දරණ පෞද්ගලික බස්රථ ධාවකයින්ගේ සමිතිය

(ඈ) ගම්පහ දිස්ත්‍රික්කයේ අංක 1 දරණ පෞද්ගලික බස්රථ ධාවකයින්ගේ සමිතිය

(ඉ) ගම්පහ දිස්ත්‍රික්කයේ අංක 2 දරණ පෞද්ගලික බස්රථ ධාවකයින්ගේ සමිතිය

(ඊ) කළුතර දිස්ත්‍රික්කයේ පෞද්ගලික බස්රථ ධාවකයින්ගේ සමිතිය

**වැරදි හා දණ්ඩන**

32. මේ ප්‍රඥප්තියේ යම් විධි විධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ දෙන ලද යම් රීතියක්, නියමයක්, විධානයක් හෝ නියම කිරීමක් කඩකරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හරින සෑම තැනැත්තෙක්ම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝුනඩු විභාගයකදී වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් එක්දහස් පන්සියය නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

**ස්ථානික දඩ ගෙවීම නියම කිරීම.**

33 පළාත් අධිකාරිය විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයෙකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන කිසිවක් කඩකර ඇති ලෙස සොයා ගනු ලැබීමේදී ඒ කඩ–කිරීම පිළිබඳ වගකීම පිළිගනු ලබන යම් තැනැත්තෙකු විසින් තමා වගකීම පිළිගෙන ඇති වරද සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ උපලේඛනයේ දක්වා ඇති දඩ මුදල, ඒ වරද සඳහා නඩු පැවරීම වෙනුවට ගෙවනු ලැබිය හැකිය. ඒ ගෙවීම පළාත් අධිකාරියේ කාර්යාලයේදී හෝ බස්නාහිර පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකදී හෝ කළ හැකි අතර ඒ ගෙවීම කරනු ලැබූ බවට සාක්ෂි වශයෙන් වූ ලදුපත ඒ සොයා ගැනීමෙන් පසු සති දෙකක් ඇතුළත පළාත් අධිකාරිය වෙත හෝ සොයා ගැනීම කරනු ලැබූ පොලිස් නිලධරයා විසින් නම් කරනු ලැබූ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙත හෝ පෞද්ගලිකව භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

පුද්ගල මණ්ඩල විසින් සිදුකරනු ලබන වරදවල් සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන් යටත්වන බව.

34. මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක–

(අ) ඒ පුද්ගල මණ්ඩල සංස්ථාවක් නම් වරද සිදුකරනු ලැබූ වේලාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකුව, සාමාන්‍යාධිකාරීවරයෙකුව, ලේකම්වරයෙකුව හෝ ඊට සමාන වෙනත් නිලධරයෙකුව සිටි සෑම තැනැත්තෙකුම: හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම් වරද සිදුකරනු ලැබූ වේලාවේදී ඒ ව්‍යාපාර ආයතනයේ හවුල් කරුවෙකුව සිටි සෑම තැනැත්තෙකුම වරද සිදු කරනු ලැබුවේ ඔහුගේ දැනුම හෝ අප සහායකත්වය නොමැතිව බව සහ ස්වකීය කර්තව්‍යවල ස්වභාවය සියළු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන වරද සිදුකිරීම වැලැක්වීම සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ තිසි සියළු උද්යෝගය ඔහු ක්‍රියාත්මක කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඔහු ඒ වරද සම්බන්ධ යෙන් වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

විධිවිධාන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතට යටත්වන බව.

35. මේ ප්‍රඥප්තියේ විධිවිධාන 1991 අංක 37 දරණ ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතට යටත්වන අතර මේ ප්‍රඥප්තිය ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතට අනනුකූල වන අවස්ථාවලදී පසුව කී පනතේ විධිවිධාන බලාත්මක වන්නේය.

අර්ථ නිරූපනය

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි-

''පළාත් සභා අමාත්‍යවරයා'' යන්නෙන් පළාත් සභාවේ ප්‍රවාහන විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ.

''බස්රථය'' යන්නෙහි, 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේය.

''මගියා'' යන්නෙහි 1991 අංක 37 දරණ බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තියේ ඊට දී ඇති අර්ථයම ඇත්තේය.

| උප ලේඛනය | (33 වෙනි ඡේදය) |
|---|---|
| | රු; ශත |
| පළමුවරට කරන ලද වරදක් සම්බන්ධයෙන් ස්ථානික දඩය | 250. 00 |
| දෙවනවරට සහ තදනන්තරව කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් ස්ථානික දඩය | 500. 00 |